සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සිංහල - I

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.)

(අ) එම්බා මහණෙනි, එදවස් චන්ද්‍රාලෝකයෙන් පන්සලට ගියා වූ ඒ සම්බුලා නම් බිසව තමාගේ වල්ලභයා නොදැක මහත් වූ සෝක දුකින් පෙළෙන්නී යම්සේ පක්ෂි ධේනුවක් තමාගේ පුතු කැදැල්ලෙහි තබා ගෝචර ග්‍රහණයට ගොස් එන වේලෙහි තුඩින් ගොදුරු ගෙනවුත් කැදැල්ලෙහි දරු බිළිඳුන් නොදැක මහත් ශෝකයට පැමිණේද එපරිද්දෙන් මේ කුමාරිකා ද වල්ලභයා නොදැක අඬ අඬා මුරගා ඇවිදිනී මෙසේ කීය. 'මේ ලෝකයෙහි සමිත පාපී ශ්‍රමණ කෙනෙක් වෙවයි බාහිත පාපී බ්‍රාහ්මණ කෙනෙක් වෙවයි ඇත්නම් ඔවුන්ට නමස්කාර කෙරෙමි. ඔවුන්ගේ සරණ යෙමි. මාගේ රාජ පුත්‍රයාණන් වහා මා ඇස දක්වයි.' මෙසේ කිය කියා අඬ අඬා පන්සල වට කොට ඇවිදිනුය. තව ද මහත් සෝකයෙන් අඬ අඬා වැළප කියන්නී 'මේ වෙනෙහි වසන සිංහ ව්‍යාඝ්‍රාදී යම් චතුෂ්පාදජාති කෙනෙක් ඇත්තාහු ද තෘණ ලතා ජාතියෙහි වසන දේවතා කෙනෙක් ඇත්තාහු ද පර්වත ගුහා ආදියෙහි වසන අල්පේශාඛ්‍ය මහේශාඛ්‍ය වූද්දයි සියලු තළාටු භූමාටු දේවතා කෙනෙක් ඇත්ද ඔහු මාගේ වල්ලභයාණන් වහා ඇස දැක්වුවාහු වී නම් ඔවුන්ට නමස්කාර කෙරෙමි. ඔවුන්සරණ යෙමි'.

(1) ඇය පන්සලට ගියේ කුමන වේලාවක ද?
(2) ඇය වල්ලභයා නොදැක වැළපෙන්නේ කවර ලෙසින් ද?
(3) ඇය හඬමින් දෙන පොරොන්දු මොනවා ද?
(4) 'සමිත පාපී' 'බාහිත පාපී' යන වචනවල තේරුම ලියන්න. (ලකුණු 04)

(ආ) "මෙසේ නිරන්තරයෙන් මහදන් පවත්වා දානපති ව වසන්නාහු එක් දවසෙක උයන් කෙළ පිණිස සර්වාභරණයෙන් සැරසී මහසෙනඟ පිරිවරා බස්නාහිර වාසලින් නික්ම සරහන ලද මාර්ගයෙන් ගොස් උයනට වැද ඒ ඒ තන්හි මොනරුන්ට රඟ මඬුලු වූ අතළගල් පෙළින් හා රක්තශ්වේතාදී පංචප්‍රකාර පද්මයෙන් සැදුම් ලද පතස් හා ගිරා මොනර චක්‍රවාකාදී පක්ෂි සමූහයා විසින් ගැවසී ලතා මණ්ඩප පන්තීන් හා නොයෙක් කුලයෙහි බමරුන් විසින් ගිගුම් දෙන ලද සල්, සපු, නා, පනා, සිහින්ගෙන්ද, එරහැන්ද ආදී වූ සුපුෂ්පිත වෘක්ෂ මාලාවෙන් හා ඉතා රම්‍ය වූ මනහර උද්‍යානයෙහි නොයෙක් විසිතුරු බලමින් ඒ ඒ තන්හි කෙළ ඇවිදිනා වූ රාජකුමාරයෝ මුල පටන් අග දක්වා ම සැදී සිටි සුපිපි හෝපලු ගසක් දැක ගස මුලට ගොස් කර ඔසවා උඩ බැලූහ. "

(1) මෙසේ ඇවිදිනුයේ කවරෙක් ද?
(2) 'පංචප්‍රකාර පද්ම' යනු කවරක් ද?
(3) ලතා මණ්ඩපයන්හි ගැවසී ගත් පක්ෂීන් කවරේ ද?
(4) 'අතළ ගල් පෙළින්', 'රක්තශ්වේතාදී' 'වෘක්ෂමාලාවෙන්' යන පදවල අර්ථ දක්වන්න.

(ලකුණු 04)

(ඉ) බුදුහු දෙව්රම් වෙහෙරදී උපාසක පර්ෂදය, උපාසිකා පර්ෂදය, භික්ෂු පර්ෂදය, භික්ෂුණී පර්ෂදය යයි සිවුවනක් පිරිස් ද, තවත් සවුමහරජයෙහි පිරිස, තව්තිසා පිරිස, රජ පිරිස, බමුණු පිරිස, මාර පිරිස, ගොවි පිරිස, මහණ පිරිස, බඹ පිරිස යන අටවනක් පිරිස් පිරිවරා බණ වදාරන සේක් එන සැටිය නපුරු වූ ද කප්ලක්ෂයක් පැරුම්පුරා ආ හෙයින් ඒ ලෙසින් යහපත් ව එන හිරිඹතප් සළු නො ලදින් උපන් වනිත් එන සිටුදුවණියන් පෘතග්ජන ලෙසින් තව බිළිඳි තැනැත්තවුන් දුටු සේක."

(1) සිවුවනක් පිරිස කවරේ ද?

(2) එන සැටිය නපුරු යැයි මෙහි පැවසෙන්නේ කුමක් නිසා ද?

(3) 'හිරිඹතප්සළු' යන්නෙහි අර්ථාලංකාරය ලියන්න.

(4) 'සවුමහරජයෙහි' 'කප්ලක්ෂයක්' 'උපන්වනිත්' යන පදවල අර්ථ දක්වන්න.

(ලකුණු 04)

(ඊ) වනසර දැක තම බිය සලසා
ගන ගැබ ලෙළ දෙන විදුලිය විලසා
වන ගැබ ඔබිනොබ පැන යන නොලසා
තැන තැන මුව රළ දැක යව සතොසා

වනවිල් වැද බොල් සෙවෙළැඟ තවරා
යන වල් කැල ඇරගෙන අතිනුදුරා
දිගු උල් සිඟු යොමු කර කර අඹරා
පිළිමල් වන මීවුන් දකු නුදුරා

(1) මුවන් වනයේ පැන යන ස්වරූපය කවියා දැක ඇත්තේ කෙසේ ද?

(2) මෙහි දැක්වෙන පරිදි මීහරකුන්ගේ රෞද්‍ර විලාසය කෙබඳු ද?

(3) 'වනසර', 'නොලසා', 'සිඟු', 'පිළිමල්' යන පදවල අර්ථ ලියන්න.

(4) 'ඔබිනොබ', 'සෙවෙලැඟ', 'අතිනුදුරා' යන පද විසන්ධි කොට ඒවායෙහි සන්ධි නාමය ද ලියන්න

(ලකුණු 04)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(1) 'ඒ මිනිය දක්නා පිණිස වැඩිය මැනව.'

(2) 'ඒ වරය මා කැමති විටෙක ඇර ගනිමි.'

(3) "මොවුන් ඇර අනික් මනුෂ්‍ය ස්ත්‍රියක තබා දිව්‍ය ස්ත්‍රියක පාවා දුන ද මාගේ මනෝරථය පිරෙන්නේ නො වෙයි."

(4) "නො ලද හොත් මෙතරම් තරයක් ඇති තැනැත්තෝ නො යෙති."

(5) "ටික දවසකට ද පිටරට යන්නේ?"

(6) "දේවිය නියම කරන හැටියක්."

(ලකුණු 08)

(ඌ) පහත දැක්වෙන පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

'අපේ රටේ දරුවන් සිවු දෙනෙකුට ස්වීඩනයේ මව්පිය ස්නේහය ලැබීමේ වාසනාව උදා වී තිබේ.'

පුවත්පත් වාර්තාවක්

වැහැරී ගිය උකුළේ නැත
සුව යහනක් සැදුණේ
වියළී ගිය දෙතනේ නැත
කිරි බිඳුවක් එරුණේ
කප පවතින තුරු නොනිමෙන
සුසුමෙන් සමු ගැනුණේ
හිරු ගිලිහෙන මොහොතක නුඹ
මඟ අයිනක රැඳුණේ

උපන් බිමට නුඹ වැඩිවා මිසක දුවේ
වැදූ මවට නුඹ වැඩියක් වීද දුවේ
දුක් උසුලා ඉන්නට මට හැකිය දුවේ
නැව් නැඟිලා දුරු රටකට යන්න දුවේ

පෙර කළ මහ පින් මහිමෙනි
මේ දෙස උපදින්නේ
ඉපදෙනු මිස රැඳෙනා පින
ඇයි නුඹ සතු නොවුණේ
දරුවන් ඇස කඳුලෙන් ළය
උණු වන මිනිසුන්නේ
සරණින් ලොව කොතැනක වුව
සැනහෙන් දියණියනේ

මතුයම් දිනෙක සිතිවිල්ලෙන් සිටින සඳ
දැතක පහස සිහිනෙන් මෙන් දූනේවිද
සිතියම් පොතින් ලොව විමසා බලන සඳ
කඳුලක හැඩය මහ සයුරේ දකීවිද

(ලකුණු 16)

(02) 'කතු හිමිගේ භාෂා නෛපුණ්‍යයත්, කතා කීමේ කලාවත් නිසා සද්ධර්මරත්නාවලිය පාඨක ශ්‍රාවක සිත් සතන්හි සදානුස්මරණීය ධර්ම ග්‍රන්ථයක් ලෙස තැන්පත් වී ඇත.' උක්ත කියමන නිර්දිෂ්ට කතා ඇසුරෙන් පහදන්න. (ලකුණු 15)

**නැතහොත්**

'ජාතක කතා යනු අප නිර්වාණය කරා මෙහෙයවන හුදු බණක් ම දෙසන්නක් නොව, අප කා හටත් අත්‍යන්තයෙන් උරුම වන කුටුම්බ ජීවිතයේ අහුමුළු පෙන්වා දී, උත්තම පවුල් ඒකක බිහි කරලන, යහ සමාජ මාර්ගයක් කරා අප මෙහෙයවන්නට රුකුල් දෙන්නකි.' නිර්දිෂ්ට කතා දෙකක් ඇසුරෙන් උක්ත කියමන විමසන්න.

(ලකුණු 15)

(03) 'සදාචාර ගුණ සම්පන්න සමාජයක් බිහිකරලීමෙහි ලා උත්සුක වීම සද්ධර්මාලංකාර කතුවරයාගේ පරමාර්ථය විය.' නියමිත කථා ඇසුරු කරනිමින් උක්ත කියමන පිරික්සන්න. (ලකුණු 15)

(04) 'චිත්තාකර්ෂණීය පද රචනයක් මෙන් ම කාලීන සමාජය පිළිබඳ තතු හෙළිකරන කෘතියක් ද වශයෙන් ගිරා සංදේශය වැදගත් ය.' විමසන්න. (ලකුණු 15)

(05) "භාෂාවේ ඇති ගීතාත්මක වූත්, හෘදයංගම වූත් බව නිසා මළගිය ඇත්තෝ උත්කෘෂ්ට නවකතාවක් ලෙස සැලකිය හැක." විමසන්න.

(ලකුණු 15)

(06) 'මිනිස් ගුණ හා නුගුණ නිරූපණය කරමින් සමාජ තතු නොසඟවා කීමට බොහෝ කෙටිකතාකරුවන් උත්සුක වී ඇත.' මෙය නිර්දිෂ්ට කෙටිකතා දෙකක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 15)

(07) 'නූතන කවීන් යථාර්ථය මැනවින් හෙළිකරන්නට දක්වූ උනන්දුව සිය නිර්මාණ තුළින් ප්‍රකට කර ඇත.' පූර්වෝක්ත අදහස සැබෑදැයි පිරික්සන්න. (ලකුණු 15)

(08) 'උදයන රාජ චරිතය රාජ පෞරුෂය අභිබවමින් යන අනුරාගය මුසු වූ යෞවනත්වයක් ප්‍රකට කරන්නකි.' මෙහි සත්‍යාසත්‍යතාව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## සිංහල - II

**13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය ද, දෙවන කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු ලියන්න.
- පළමු කොටස හා දෙවන කොටස පිළිතුරුපත් සමඟ අමුණා භාරදෙන්න.

## I කොටස

- එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

(01) (1.1) උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ගීකරණයේදී පහත සඳහන් අක්ෂර කාණ්ඩ අයත් වන අක්ෂර වර්ගය නිවැරදිව අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

**(අ)** ච, ඡ, ජ, ඣ, ඤ, ජ, ය **(ආ)** ෂ, ෂෘ, ට, ඨ, ඩ, ඪ, ණ **(ඉ)** ත, ථ, ද, ධ, න, ලු, ස

**(ඊ)** උ, ඌ, ප, ඵ, භ, බ, ම

(1) තාලුජ, දන්තජ, මූර්ධජ, ඕෂ්ඨජ (2) තාලුජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ
(3) මූර්ධජ, දන්තජ, තාලුජ, ඕෂ්ඨජ (4) දන්තජ, තාලුජ, මූර්ධජ, ඕෂ්ඨජ
(5) තාලුජ, මූර්ධජ, ඕෂ්ඨජ, දන්තජ

(......)

(1.2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) තුෂ්ණිම්භූත, දවුල, තෙරනුවෝ, සෙබලා
(2) දක්ෂිණ, චණ්ඩාල, උත්කෘෂ්ට, උලුවස්ස
(3) ආකර්ෂණ, අහළ පහළ, අභිලාශ, අර්ණව
(4) පන්සිලු, පනකුරු, න්‍යෂ්ටිය, නිශ්චල
(5) ප්‍රත්‍යවේක්ෂණ, ප්‍රශස්ති, ප්‍රභේද, ප්‍රස්තාව පිරුළු (......)

(1.3) අකාරාදී පිළිවෙල අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) චක්‍රලේඛ, චක්‍රායුධ, චක්‍රාවාට, චක්‍රපාණී
(2) තිරිවාණ, තිරශ්චීන, තිසුලවි, තිළිණ
(3) දුශ්චරිත, දුෂ්කර, දුෂ්පෝෂණය, දුස්සාධ්‍ය
(4) කෘත්‍රිම, කෘමිනාශක, කෘෂ්ණ, කෘෂිකර්මය
(5) කර්මණ්‍ය, කර්තව්‍ය, කර්කශ, කර්ණය (......)

(1.4) පහත සඳහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යඤ්ජන අක්ෂරයකට මුලින්, උඩින්, යටින් හෝ අගින් පිලි නො යෙදේ.
(2) ව්‍යඤ්ජන අක්ෂරයකට 'අ' ස්වරය එක් වූ විට හල්ලකුණ ඉවත් නොවේ.
(3) අක්ෂර මාලාවේ සියලු ම ස්වර ඝෝෂාක්ෂර වේ.
(4) ශිථිලාක්ෂර යනුවෙන් හැඳින්වෙන්නේ අල්පප්‍රාණ අක්ෂර නොවේ.
(5) උගුර උත්පත්ති ස්ථානය කරගෙන උච්චාරණය වන්නේ මූර්ධජ අක්ෂරයි. (......)

(1.5) රකාරාංශය, රේඵය, යංශය හා ගැටපිල්ල සහිත වචන අනුපිළිවෙලින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) කෘතගුණ, ස්වර්ණාලේප, ධ්‍යාන සුඛ, ප්‍රත්‍යාර්ථ
(2) සාකච්ඡා, ධ්වන්‍යාලෝක, අධිගෘහිත, ද්‍රාවණ
(3) ප්‍රහසන, නිර්මාණ, උපන්‍යාස, කෘත්‍යාධිකාරී
(4) උත්කෘෂ්ට, අවතීර්ණ, ආක්‍රෝෂ, වින්ධ්‍යා
(5) ත්‍රෛලෝක, නිරවද්‍ය, පර්ථිත, තෘප්ත (......)

(1.6) එකිනෙක අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) සහස්‍ර වසර, ස්වෛරී රාජ්‍යය, ස්මරණ ශක්තිය, ජනසවිය
(2) චන්ද්‍රබිම්බ, උද්භිද විද්‍යාව, ශල්‍ය කර්ම, මිථ්‍යාදෘෂ්ටි
(3) ගොළු මුහුද, ගෞරවාන්විත කාර්යය, ගැටලු විසර්ජන, ගුරුත්වාකර්ෂණ ශක්තිය
(4) දකුණු ශාඛාව, දුහුල් සළු, නිරර්ථක ප්‍රයත්නය, ධාතුගර්භ
(5) රන්වර්ණ, ඥාති සබඳකම්, සප්ත කන්‍යා, ත්‍රිශූල අවිය (......)

(1.7) තත්සම වචන පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

(1) ලකුණ, රොස්, ශරීරය, ව්‍යවහාර (2) ශෘංගාර, ෂඩ්භාෂා, දෙසුම, සැත්කම්
(3) මෘදංග, බ්‍රාහ්මණ, මැණික්, මිහිරි (4) ශාස්ත්‍රෝද්ග්‍රහණ, යෞවන, බුදු, ව්‍යංග්‍යාර්ථ
(5) දේශාභිමානී, දෛවෝපගත, දූරදර්ශී, ලංකේශ්වර (......)

(1.8) මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) එහා මොබ, මෙපිට, මෙහා, ඔබ
(2) කෘෂ තර, මහත, ස්ථූල, තරබාරු
(3) කම්මැළි අනලස්, කඩිසර ක්‍රියාශීලී, කාර්යශූර
(4) පසුව කලින්, පූර්වයෙන්, පෙර, ප්‍රථමයෙන්
(5) ගෞරව අපමණ, අවමාන, නිගරු, නිග්‍රහ (......)

(1.9) මුලින් දැක්වෙන පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) ශක්‍ර සහසැස්, විදුරවි, පුරඳර, වජිරපාණී
(2) අනංග කුසුමබාණ, මන්යොන්, මලවි, පන්සැර
(3) ඇස් නයන, නේත්‍ර, චක්ෂු, අක්ෂි
(4) පොළොව පෘථිවි, මේදිනි, මහී, වසුධා
(5) සමුද්‍ර උදධි, දලනිඳු, ශ්‍රොතස, සලිලාර (......)

(1.10) විශේෂණ, විභක්ති, අන්‍යාර්ථ හා අව්‍ය යන සමාසවලට අයත් පද පිළිවෙලින් දක්වා ඇති පද පේළිය තෝරන්න.

(1) බටහිර, ලියකොමළ, අනවශ්‍ය, සහසකර
(2) නිල්මැණික, රන්කම්, දිනකර, අලස
(3) විදුරපඬි, දුම්දුරු, දෙව්දත්, අනුහුරු
(4) සුදන, ශිෂ්‍යාධාර, හදමැඳුර, අවමඟුල
(5) පවර, මුහුදුසුළං, මල්හිනා, නිලුපුල් (......)

(1.11) කෘදන්ත පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) පිසමන්, කියුම්, පැරදුම්, ලියන
(2) දිනනු, නැටිලි, ළතැවුම්, බැලෙනා
(3) පුවළ, කළ, ගිය, අත්හළ
(4) හිනැහෙන, කුසුමන්, සුපතළ, ගිලිහුණු
(5) දඟලිලි, ගයනා, මැරූ, පැනිලි (......)

(1.12) තද්ධිත පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) නාගරික, ලෞකික, අයෝමය, ජ්‍යෙෂ්ඨ
(2) සිඟිති, කොයිබ, දනතා, බොකුටු
(3) පහටි, කළටි, වකුටු, ඉසුරුමත්
(4) පියාණෝ, පැනිති කැහැටු, දුහැටි
(5) ධෛර්යවත්, නෙත්‍ර, බිබිලි, වරලස් (......)

(1.13) **නිපාත පදයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.

(1) අනේ, විනා, මෙන්, ලු (2) විසින්, කෙරෙන්, වනාහි, යළි (3) සේ, සහ, ද, කැටුව
(4) අහෝ, හෝ, නො, උප (5) සෙද, ම, ඉක්බිති, පිණිස (......)

(1.14) **සමාස පදයක්** ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) සොරබිය, විදේශාධාර, මුහුදුසුළං, ඇස්වහ
(2) ගස්වැල්, දියගොඩ, ගුරුදෙගුරු, තෙල්මල්පහන්
(3) කිරිබත්, සැත්කම්, රන්මාලා. මැටිපෝච්චි
(4) සරාසඳ, තලතෙල්, ගම්වැසි, හේන්මිරිස්
(5) ගල්හිත, සඳවත, තිසරතන, රිදීමුවා (......)

(1.15) **එකම වර්ගයට අයත් නොවන සන්ධිපද** ඇතුළත් වරණය තෝරන්න.

(1) වක්කඩ, දුප්පත්, අල්ලස්, අස්සන (2) දෙයාකාර, කටුවල, ගෙවුයන, නිරවුල්
(3) කම්මල, ගොක්කොළ, සුරත, තම්පලා (4) ගම්පොළ, මුංකැවුම්, ළිංමිදුල, පොළොන්නරුව
(5) දඬුවම්, සුරුවම්, සිතුවම්, බිලියම් (......)

(1.16) **ව්‍යාකරණානුකූලව නිවැරදි** වාක්‍ය තෝරන්න.

(1) 'ගම්බද ක්‍රීඩකයෝ ක්‍රිකට් ශූරතාවය දිනා ගනිති'යි සංවිධායකයෝ නොසිතූහ.
(2) දළු නෙළන්නියන් උදැසනම තේ වතු කරා පැමිණ ඇත.
(3) කුකුළෝ හඬලද්දී මම අවදි වුණෙමි.
(4) ගංගාවෝ සිරිලක සරු කරමින් සයුරට ගලාබසී.
(5) ඔබ ගිලනුන්ට උවටැන් කළේය. (......)

(1.17) වන **සෞන්දර්ය** නරඹමින් ඈ **සුරත** දිගුකර **ගස්වැල්** පිරිමැද්දාය. යන වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත පද පිළිවෙළින් අයත්වන ව්‍යාකරණ අංග නිවැරදිව සඳහන් වරණය තෝරන්න.

(1) තද්ධිත, සමාස, සන්ධි
(2) සන්ධි, සමාස, තද්ධිත
(3) තද්ධිත, සන්ධි, සමාස
(4) සමාස, සන්ධි, තද්ධිත
(5) සමාස, තද්ධිත, සන්ධි (......)

(1.18) පහත සඳහන් වැකිවල **තද කළු අකුරින්** මුද්‍රිත පද අයත් **ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

❖ සඳ කොමළී තරු **පිරිවරලා**
❖ **එන්න** මඳනලේ ගොස් පවසන්න දුක මගේ
❖ **ඇදී ඇදී** එන්න නදී රිදී තොටිල්ලේ
❖ පුන්පෝදා සඳ ඔබ ගෙන **ආවොත්** මල් වට්ටියකට අරගන්නම්
❖ කැලේ තිබෙන කොයිදේවත් **රසවේවා**

(1) පූර්ව ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
(2) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා
(4) ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා
(5) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා (......)

The National e-learning Portal for The General Education

(1.19) **උපසර්ගයක්** යෙදී **නැති** පදයක් සහිත වරණය තෝරන්න.

(1) අවමඟුළ, විමල, දුදන, අතිරස
(2) අනුකරණ, විදේශ, සුසිරිත්, අවභාවිතය
(3) නිකැළැල්, පියන, සුගම, නිවහල්
(4) නිරුදක, නොමිනිස්, අනුහුරු, උපැස්
(5) උපවන, නිර්දය, විරූපී, විසංවාද (......)

(1.20) වඩාත් ම **නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.

(1) අපි නුඹලාගේම සොහොයුරෝ නොවෙම්ද?
(2) අධ්‍යක්ෂ තුමිය අපවෙත පැමිණියා ය.
(3) නො කළ වරදකට ඔවුහු අපට තැලුවෝ ය.
(4) බුදුහු ද කුණු කකුල පෙරට තබා ගමන්කළ සේක.
(5) හේ ධාර්මික ව ජීවත් වීමට සිතා නරක පුරුදු අත හැරියේ ය.
(......)

(ලකුණු 20)

## II කොටස

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

(02) (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පංජාබය වනාහී ඉන්දියාවේ මුදුන් මිණ වැන්න. භූමි ප්‍රදේශයෙන් බලන විට ප්‍රංශයෙන් අඩක් පමණ වූ පංජාබය වයඹ දෙස ඉන්දු නදී තීරයේ සිට දිල්ලියේ වියළි බිම මත දෙවියන් විසින් මවා තිබූ ක්ෂේම භූමියක් බඳු වූ පංජාබය ගංගාවලින් මෙන් ම ක්ෂිතිජය තෙක් පැතිර ගිය රන්වන් සරු තිරිඟු යාය වලින් ද සමන්විත වූ ප්‍රදේශයක් විය. පංච ගංගා රාජ්‍ය යයි නම් ලද පංජාබ පසේ සශ්‍රීකත්වයට මූලික හේතුව වුනේ මෙම ගංගාවන්ය. ඉන්දියාවට ඒ නම ලැබුණේ ද මෙම ගංගා අතුරින් විශාලතම වූ ඉන්දු නදිය නිසා ය.

වසර පන්දහසක ඉතිහාසය පුරා පැතිර ගිය සංග්‍රාම හා වියවුල්වලින් පංජාබය සිය අනන්‍යතාව ගොඩනගාගෙන තිබුණි. හින්දු ශුද්ධ ග්‍රන්ථය වූ 'භගවත් ගීතාව' බිහි වූයේ ක්‍රිෂ්ණා හා රණශූර අර්ජුන් අතර වූ සංවාදයකිනි. ඉන්දියාවට ඉස්ලාම් ආගම ගෙන ආ හන්වරුන් හා කාලිප්වරුන්ගේ පාලනයට යටත් වන තුරු මෙම ප්‍රදේශය මෞර්ය, ක්ෂත්‍රිය, පාතියානු වර්ග යටතේ පාලනය විය. සියවස් තුනක මෝගල් පාලනය යටතේ ඉන්දියාව එහි උච්චස්ථානයට පත් ව තිබූ අතර පංජාබය පුරා විසිර ඇති මිල කළ නොහැකි නටබුන් සම්භාරය එකල වූ ඓශ්වර්යය හෙළිකරයි. අවසානයේ දී පංජාබයේ ස්වදේශීය සික් ජනතාව පංජාබයේ බලය අල්ලාගත් අතර බ්‍රිතාන්‍යයන් විසින් පංජාබය යටත් කර ගන්නා තුරු ම එය පාලනය කළහ.

(1) ඉන්දියාව තුළ පංජාබය උපමා කොට ඇත්තේ කුමකට ද?
(2) පංජාබය පාලනය කළෝ කවරහු ද?
(3) පංජාබය යන්නෙහි අරුත කුමක් ද?
(4) පංජාබයේ ස්වදේශික ජනතාව වූයේ කවුරුන්ද?
(5) ඓශ්වර්ය, උච්චස්ථානය යන වචන වල අරුත් පැහැදිලි කරන්න.

(ලකුණු 2×5 = 10)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වනසේ සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සන්නිවේදනය හා සම්බන්ධ මූලික අංග ලක්ෂණ තුනක් ඇත. මේවා නම් සන්නිවේදකයා, පණිවුඩය හා ග්‍රාහකයා ය. සන්නිවේදකයා හෙවත් පණිවුඩය දීමේ අභිලාශය ඇති පුද්ගලයා වෑයම් කරන්නේ තමාට හැකි පමණින් පැහැදිලි ලෙස යම් සංකේත සමූහයක් ගොඩනැගීමයි. අතින් හෝ හිසින් කරන සංඥාවක්, ශරීරාංගයකින් කරන ඉඟියක්, කටින් නිපදවන හඬක් හෝ වචනයක් පැනෙන්, මුද්‍රණ යන්ත්‍රයෙන් ලියැවෙන අකුරක් හෝ වචනයක් යන මේ ආදී කවරෙහිත් යම් අදහසක්, පණිවුඩයක් අන්තර්ගත නිසා ඊට සංකේත යන පදය යොදා ගත හැකිය. මෙබඳු සංකේත භාවිත කරන සන්නිවේදකයාගේ අපේක්ෂාව වන්නේ ග්‍රාහකයා තුළ ඒ මගින් ප්‍රතිචාරයක් ඇති කිරීමයි. මෙම ප්‍රතිචාරය වාචික හෝ අවාචික විය හැකිය. ඇසට කනට ස්පර්ශයට ගෝචර විය හැකිය. මේ සන්නිවේදන ක්‍රියාවලිය හා සම්බන්ධ මූලික පියවරයි. කිසියම් ග්‍රාහකයෙක් තමා වෙත යොමු කරන සංකේත ඇසුරෙන් කිසියම් පිළිවෙළකින් යුත් පණිවුඩයක්, අර්ථයක් නිර්මාණය කරයි. මෙය වූ කලී සන්නිවේදන ක්‍රියාවලිය හා සම්බන්ධ දෙවන පියවරයි. සන්නිවේදකයන් ග්‍රාහකයන් එකිනෙකා සමග සම්බන්ධයක් ඇති කර ගන්නේ පණිවුඩය මගිනි. කිසියම් පණිවුඩයක් මගින් ඒකාබද්ධ කරනු ලබන ක්‍රියාදාමය සන්නිවේදනය වශයෙන් හැඳින්වීම යෝග්‍ය ය. එබැවින් පණිවුඩය සන්නිවේදනය හා සම්බන්ධ තුන්වන මූලික අංග ලක්ෂණයයි. මෙසේ ප්‍රධාන වශයෙන් සන්නිවේදකයා, පණිවුඩය, ග්‍රාහකයා යනුවෙන් තෙවැදෑරුම් ලක්ෂණ වලට සීමා කර දැක්වෙතත් සන්නිවේදන කාර්යය බෙහෙවින් සංකීර්ණ ය. (ලකුණු 15)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 350 අතර වන සේ ව්‍යාකරණානුකූලව විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(1) ආරක්ෂාවට සිටින්නන් අතින්ම අනාරක්ෂිත වර්තමාන දරු පරපුර.

(2) කැළිකසළ බැහැර කිරීමේ අවිධිමත්භාවය නිසා ඇති වන පරිසර දූෂණය.

(3) වත්මන් පරපුරේ මානසික ආතතිය හා සියදිවිනසා ගැනීම්.

(4) දිනෙන් දින උග්‍ර වන මහාමාර්ග අනතුරු

(5) ස්වයං රැකියා මඟින් ලැබෙන නිවහල් හැඟීම, ආත්ම තෘප්තිය හා ආර්ථික ප්‍රතිලාභ.

(ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල <u>සදොස් තැන් ඇතොත් නිදොස් කොට</u> ලියන්න.

(1) හිමි පා වෙහෙරට වැඩම කර දහම් දෙසූ සේක.

(2) පියුම්හු දිනකර පහස ලබමින් විකසිත වෙයි.

(3) සාහිත්‍යධරයන් වනාහී ප්‍රඥාප්‍රදීප දල්වන්නන් වෙති.

(4) භාෂාරීතීන් කලින් කලට වෙනස් වෙයි.

(5) සියලුම ශ්‍රී ලාංකිකයන් එක මවකගේ දරුවන් වේවා. (ලකුණු 05)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(1) වනාන්තරයෝ වනසතුන් ආරක්ෂා කරති.

(2) හමුදා සෙබලු කැඩුණු පාලම් අලුත්වැඩියා කරති.

(3) කොල්ලකරුවෝ බැංකුවට කඩාවැදී මුදල් පැහැර ගති.

(4) විශ්වවිද්‍යාල ආචාර්යවරු නවක වදයට ලක්වූ සිසුවෙකු රෝහල් ගත කරති.

(5) හාමුදුරුවෝ උපාසක උපාසිකාවන්ට බණ දෙසති.

(ලකුණු 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහනින් තෝරා ලියන්න.

(1) ................................................ (අයෙකු / අයෙක්) විනෝදාංශයක් ලෙස රූපවාහිනිය නරඹති.

(2) ජනමාධ්‍යවේදියාගේ (මැණියන් / මැණියෝ) .............................................. අභාවප්‍රාප්ත වෙති.

(3) බහුශ්‍රැතයෝ බොහෝ ඇසූ පිරූ තැන් (ඇත්තන් / ඇත්තෝ) .................................................... වෙති.

(4) (කුමාරතුංගයන් / තුමාරතුංගයෝ) ලියූ ''ව්‍යාකරණ විවරණය' දනුදු පාඨකයෝ කියවති.

(5) විශාරදයන් / විශාරදයෝ භාෂාරීතීන් හඳුනා ගනිති

(ලකුණු 05)

(05) (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

(1) මෑ හැර **රාජ කන්‍යාවක** ලැබුණද තමාගේ මනදොළ නොපිරෙන්නේ යැයි සාළිය කුමරු සේවිකාවට කීවේය.

(2) ඇමති **ධුරන්ධර** තම හැකියා දකිත් ම හේ ගරුසරු ඇතිව **පසෙකට** විය.

(3) සද්ධර්මාලංකාර කතු හිමියන් විසින් **අතිවර්ණික** අසෝක මාලාව සැබෑම රූමතියකි.

(ලකුණු 03)

(ආ) පහත සඳහන් යෙදුම් වලට **වඩාත් සුදුසු තනිපදය** ලියන්න.

(1) කතාවකට දෙන පිළිතුර

(2) ආහාර හිඟ කාලය

(3) යුද්ධය සඳහා අඳින ලෝහමය හැට්ටය (ලකුණු 03)

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත්ම ගැලපෙන පදය** පහළ වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(1) මෙවර වෙසක් ..................................................................... රජයේ අනුග්‍රහයෙන් කොළඹදී පැවැත්විණි.

(2) තැන තැන මලින් සැදී ගිය ලිය .................................................................. විය.

(3) ගිය වර රාජ්‍ය සාහිත්‍ය ................................................................ අනුරාධපුරයේදී පැවැත්විණි.

(4) අමාත්‍ය ....................................... වෙනසක් ළඟදී ම සිදුවනු ඇත.

(5) බලවත් රටවල් නිතර ම යුද්ධ ................................................. වල යෙදෙති.

(6) ප්‍රාචීන භාෂාවලින් ලබන ලද ................................................... සිංහල සාහිත්‍යය පෝෂණයට හේතු විය.

(අභ්‍යාස, මණ්ඩල, අභාසය, මඩුලු, උළෙල, උත්සවය)

(ලකුණු 03)

(ඊ) **තද කළු අකුරින්** දක්වා ඇති **බහු අර්ථ පදය** යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් ලියන්න.

(1) මා එන **තුරු** එහි ම සිටින්න.

(2) ඡද්දන්ත ඇතු පොකුරු **මී** හා නෙළුම් දලි පසේ බුදුන්ට පිදීය.

(3) සිඟිති පුතු **වද** මල කඩා පෙති ඉහිරුවේය.

(4) එසැණින් ඇගේ **වත** මැළ වී ගියේය.

(5) හේ දිනපතා මැහැල්ලගේ තල පැදුරෙන් **තල** මිටක් සොරකම් කළේය.

(6) කඳුළු **සල** සලා පැමිණි ගැහැනිය ඇගේ දුක කීවාය. (ලකුණු 06)

(06) **තද කළු අකුරින්** දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයට අයත්දැයි දක්වන්න.

(1) **වමතින්** ගත් පින්සල එහාමෙහා **කරමින්** හේ දක්ෂ **ලෙස** සිතුවම් කළේය.

(2) **ශ්‍රී ලාංකික** පුවත්පත් **කලාව** වනාහී තවත් සංවර්ධනය විය යුතු අංගයකි.

(3) **ගැමුණු** මහරජ රට **දැය සමය** රකිමින් **ආශ්චර්යවත්** පාලනයක් ගෙන ගියේය.

(4) **ජනතා** අයිතියට පැවරූ අධිවේගී මාර්ගය සංචාරක ආකර්ෂණය පවා දිනා ගනී.

(5) **සුදු මලින්** වැසී ගිය ඉද්ද ගසට **යනෙන** කුරුලු **රැන** කිචිබිචි නද දෙති. (ලකුණු 15)

(07) (අ) පහත දැක්වෙන යෙදුම්වලට ගැලපෙන **ඉඟිවැකිය / රූඩීය** ලියන්න.

(1) හමාර නොවන දෙයක්.

(2) කිසිවෙකුටත් නොකයා පලා යෑම

(3) බියක් සැකක් නැතිව යමක් කිරීම.

(4) ව්‍යාජ ආදරය

(5) බලාපොරොත්තුව විශාල වුවත් ඵලය ස්වල්ප වීම (ලකුණු 03)

(ආ) පහත දී ඇති රූඩීවල අදහස පැහැදිලි වනසේ වාක්‍යවල යොදන්න.

(1) කිඹුල් කඳුළු හෙළීම (2) අං ස්ම

(3) අතින් කිරිදෙවීම (4) අන්තිම ඉත්තත් ඇදීම

(5) අනූනවයෙන් බේරීම (6) කඩුව ගිල්ල වගේ (ලකුණු 03)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද සෑදී ඇති රටාව කුමක්දැයි දක්වන්න.

| | |
|---|---|
| (1) ළමයි බමයි | (2) තලා පෙළා |
| (3) නින්දා අපහාස | (4) දුගී මගී |
| (5) තක්කු මුක්කු | (6) දුක සැප |

(ලකුණු 03)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

| | |
|---|---|
| (1) කරකොළයා | (2) පරියා |
| (3) ඇහැක් | (4) හඳුන්පත |
| (5) අයිරුව | (6) ඉරගල වැටෙනවා |

(ලකුණු 03)

(උ) පහත දී ඇති ප්‍රාස්තවික ව්‍යවහාරයන්ට දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

| | |
|---|---|
| (1) සැහැල්ලුව | (2) ඉපනැල්ල |
| (3) බෝලත්ත | (4) අඩුක්කු |
| (5) පැඟිරි කොළ | (6) බෝර ගහනවා |

(ලකුණු 03)

(08) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බැරෝඩාප්‍රාන්තයේබහුභාර්යාසේවනයතහනම්කරතිබුණි.නිදහස්අධ්‍යාපනයහඳුන්වාතිබුණිගාන්ධිකළ
ආකාරයටනොදෙවෙනිවනඅයුරින්කුලහීනයයන්ටපහත්කොටසැලකීමටඑරෙහිවබැරෝඩාමරාජාවිශාලව
්‍යාපාරයක්මෙහෙයවීයකුලහීනයන්සඳහාතමාගේමවියදමින්අධ්‍යාපනආයතනයක්පවත්වාගෙනගියඔහුප
සුකලෙකකුලහීනයන්ගේනායකයාවූආචාර්යබිම්රුද්අම්බෙඩ්කාර්කොලොම්බියවිශ්වවිද්‍යාලයටයැවීයතම
රාජධානියේරාජස්ථාන්කාන්තාරප්‍රදේශයේනොයෙක්ජලාශහාඇළමාර්ගතනවාතමවැසියන්ගේප්‍රයෝජන
යසඳහාසශ්‍රීකබිමක්බවටපත්කළේය

(1) ඉහත ඡේදය, ශාස්ත්‍රීය යැයි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(2) යංශය සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා ලියන්න.

(3) ඡේදයේ සඳහන් රකාරාංශය හා තාලුජ ''ශ'' යන්න සහිත වචන දෙකක් ලියා දක්වන්න.

(4) ඡේදයේ ඇති ප්‍රාන්තයේ යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.

(5) රකාරංශය හා රේඵය අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

13 ශ්‍රේණිය

## සිංහල - I

පිළිතුරු පත්‍රය

(01) (අ) (1) සඳ එළිය ඇති රැයක / රාත්‍රියක

(2) පැටවුන්ට ගොදුරු සොයා ගෙන එන කිරිල්ලක පැමිණි විට කූඩුවෙහි පැටවුන් නොදැක ඇතිවන ශෝකය හා සමාන දුකකින්

(3) පව් සමනය කළ හා පව් බැහැර කළ ශ්‍රමණයෙකු සිටීද ඔවුන්ට නමස්කාර කරන බවටත්, ඔවුන් සරණ යන බවටත් පොරොන්දු දෙමින්

(4) පව් සමනය කළ, පව් බැහැර කළ (ල.04)

(ආ) (1) සාලිය කුමරු

(2) පස් ආකාර නෙළුම් / පස් පියුම්/ (ඇඹුල, උපුල, රත්පියුම්, හෙළ පියුම්, හෙල්මැලි ආදී පියුම් වර්ග පහ)

(3) ගිරව්, මොනරු, සක්වාලිහිණි

(4) අතුරන ලද ගල්පන්තීන්ගෙන්, රතුසුදු ආදී ගස් පේළියෙන් (ල.04)

(ඉ) (1) උපාසක, උපාසිකා, භික්ෂු, භික්ෂුණී යන හතර වර්ගයක පිරිස

(2) නිරුවතින් හෙවත් උපන් හැටියෙන් එන නිසා

(3) උපමාලංකාරයකි

(4) චාතුර්මහා රාජිතයෙහි එනම් දෙව්ලොවෙහි)
කල්ප ලක්ෂයක්
නිරුවතින් / ඇඳුම් නැතිව / උපන් හැටියෙම මෙන් (ල.04)

(ඊ) (1) වැහිවලාකුළෙහි ලෙළදෙනු විදුලිරේඛා මෙනි.

(2) විල්හි ගන වූ සෙවෙල ඇඟේ ගාගෙන, වල් සමූහය අතින් උදුරාගනිමින් දිගු උල් වූ අං එකිනෙකා වෙත යොමු කරගෙන සතුරු වන්නාවූ ආකාරයට

(3) වැද්දන්, අප්‍රමාදව, උල්, සතුරු

(4) ඔබිනොබ ඔබින් + ඔබ ස්වර සන්ධිය
සෙවෙලැඟ දෙවෙල් + ඇඟ ස්වර සන්ධිය
අතිනුදුරා අතින් + උදුරා ස්වර සන්ධිය

(උ) (1) පන්සිය පනස් ජාතක පොතේ එන ඡද්දන්ත ජාතකයේ අතීත කථාවෙහි එන්නකි. සෝණුත්තර වැද්දා විසින් විදින ලද ඇතුම කල, පිරිවර ඇතුන් ඒ බව පසේ බුදුන්ට දන්වා, මළ ඇතු බලන්නට පසේ බුදුන්ට පැමිණෙන ලෙස කරන ආරාධනයයි.

(2)

(3) දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ එන සාලිරාජ වස්තුවේ එන්නකි. සාලිය කුමරු චණ්ඩාලියක සරණ ගත් බව ඇසූ දුටු ගැමුණු රජු, ඊට විරුද්ධ ව, කුමරු සිත වෙනස් කරවීමට තමා වල්ලභ වූ ස්ත්‍රියක් එවූ අවස්ථාවේ එම ස්ත්‍රියට කුමරු දෙන පිළිතුරයි.

(4) දඹදෙණි යුගයේ ලියැවුණු සද්ධර්ම රත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටුවතෙහි එන්නකි. සත්මහල් ප්‍රාසාද මුදුනේ කබලු පිසින සිටුදේවිය හා සිටු දූ මුගලන් හිමි කවුළුවෙන් එපිට අහසේ සිටිනු දැක මුගලන් හිමි එතැනින් පහ කිරීමට නොයෙක් දේ කීවද ඒ නොඅසා මුගලන් හිමි අහසේ සක්මන් කළ බව ද දුටු විටදී සිටුතුමා විසින් සිතන ලද්දකි.

(5) සරච්චන්ද්‍රයන්ගේ මළගිය ඇත්තෝ නවකතාවෙහි එන්නකි. නොරිකෝ විසින් දෙවොන්දරාට පැවසූවකි.

(6) ශ්‍රී හර්ෂ දේවගේ රත්නාවලී නාට්‍යයේ එන්නකි. උදයන රජු විසින් වාසවදත්තාට කීවකි. (ල. 2 × 4 = 8)

(ඌ) රසාස්වාදය ලිවීමට (ල. 16)

02 ප්‍රශ්නයේ සිට 08 ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලට ලකුණු 15 බැගිනි.